දෙපාර්තමේන්තු චක්‍රලේඛ : 05/2020

මගේ අංක : D1/චක්‍රලේඛ
බන්ධනාගාර මූලස්ථානය.
කොළඹ 09.
2020/07/.19......

සියළුම බන්ධනාගාර අධිකාරීන් / සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත,

<u>බන්ධනාගාර තහනම් ද්‍රව්‍ය වලින් තොර පරිශ්‍රයක් බවට පත් කිරීම.</u>

දශක කිහිපයක සිට බාහිර සමාජයේ මෙන්ම බන්ධනාගාර අභ්‍යන්තර පරිසරයේද නිරන්තරයෙන් සාකච්ඡාවට භාජනය වන තහනම් මත්ද්‍රව්‍ය හා ජංගම දුරකථන භාවිතය යම් පමනකට අඩු කර ගැනීමට ඔබ හා ඔබගේ කාර්යය මණ්ඩලය උත්සහ කර තිබීම අගය කරමි.

02. නමුත් බුද්ධි අංශ හා බන්ධනාගාර සෝදිසි කිරීම් වලදී ජංගම දුරකථන හා තහනම් මත්ද්‍රව්‍ය අත් අඩංගුවට ගැනීම නිරන්තරයෙන් වාර්තා වන අතර මෙහි සැළකිය යුතු අඩුවීමක් දක්නට නොමැත. බන්ධනාගාර පරිපාලනයේ එක් වගකීමක් ලෙස තහනම් ද්‍රව්‍ය බන්ධනාගාර තුළට ඇතුල් වීම වැළැක්වීම හා බන්ධනාගාර තුළ භාවිතය සිදු නොවීමට වග බලා ගැනිම බන්ධනාගාර අධිකාරී / සහකාර අධිකාරී වරුන්ගේ වගකීමෙන් බැහැර නොකළ යුතු කාර්යක් බැව් අවධාරණය කරමි.

03. අභ්‍යන්තර පරිපාලනයේ පවතින දුර්වලතා මගහරවා ගැනීමටත්, බන්ධනාගාරය තුළට තහනම් ද්‍රව්‍ය ඇතුල්වීම වැළැක්වීමටත්, බන්ධනාගාර තුළ තහනම් ද්‍රව්‍ය භාවිතය සිදු නොවීමටත් ඔබ විසින් වග බලා ගත යුතු අතර, ඒ සඳහා නිශ්චිත හා ප්‍රශස්ථ වැඩ සටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරිමටත්, පසු විපරම් කිරීමටත් ඒ අනුව ඉහළ ප්‍රගතියක් අත්කර ගැනීමටත් කටයුතු කරන ලෙස මෙයින් දැනුම්දෙමි.

04. තවද පවතින සම්පත් උපයෝගි කර ගනිමින්, ඔබ බන්ධනාගාරය තහනම් ද්‍රව්‍ය නොමැති පරිශ්‍රයක් බවට පත් කර ගැනිමට උනන්දුවෙන් හා වගකීමෙන් අවශ්‍ය පියවර ගන්නා මෙන් අවධාරණයෙන් දැනුම් දෙමි .

පී.එම්.ජේ.ඩබ්ලිව්. තෙන්නකෝන්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්